සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

නම / විභාග අංකය :-.............................................................. කාලය: පැය 02 යි

නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මහජන මතයට ගරු කළ අවස්ථාවක් වන්නේ,
   (1) දෙමාපිය අවසරයකින් තොරව දරුවන් මහණ නොකිරීමට ශික්ෂා පද පැනවීම.
   (2) චන්න හිමියන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීම.
   (3) සුභද්‍රට බුදුරජාණන් වහන්සේ හමුවීමට අවස්ථාව ලබා දීම.
   (4) මාතෘ දිව්‍ය රාජයාට ධර්මය දේශනා කිරීමට දෙව් ලොවට වැඩම කිරීම.

2) පංචවරය ඉදිරිපත් කළේ,
   (1) සැරියුත් හිමියන් ය
   (2) දෙව්දත් හිමියන් ය
   (3) මුගලන් හිමියන් ය
   (4) ආනන්ද හිමියන් ය

3) බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය මුල මැද අග යන තුන් තැන්හිම යහපත් වන ගුණය,
   (1) සන්දිට්ඨික ගුණය
   (2) අකාලික ගුණය
   (3) ස්වාක්ඛාතෝ ගුණය
   (4) ඒහිපස්සිකෝ ගුණය

4) "කිරිකඩ හේලය" නම් වස්ත්‍රයක් පිළිගැන්වීමේ චාරිත්‍රය ඉටු කරන්නේ,
   (1) අවමංගල උත්සවයකදී ය
   (2) උපන්දින උත්සවයකදී ය
   (3) පිරිත් පින්කමක දී ය
   (4) සරණ මංගල උත්සවයකදී ය

5) මහාසාර බමුණු කුලයෙහි උපන් මොග්ගල්ලාන බැමිණියගේ පුත්‍රයා වන්නේ,
   (1) කෝලිත ය
   (2) උපතිස්ස ය
   (3) දේවදත්ත ය
   (4) නන්ද කුමරු ය

6) භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනක පැවැත්ම පිණිස පනවා වදාළ ශික්ෂාපද සමූහය හඳුන්වන්නේ,
   (1) පංචශීල ප්‍රතිපදාව යනුවෙනි
   (2) අෂ්ටාංගික ශීලය යනුවෙනි
   (3) දස සීලය යනුවෙනි
   (4) සේඛියා යනුවෙනි

7) විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි. මෙහි තේරුම වන්නේ,
   (1) මම උස් අසුන් පරිහරණයෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නයි.
   (2) මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නයි.
   (3) මම බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නයි.
   (4) මම නොකල්හි ආහාර වැළඳීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නයි

8) සිගාලෝවාද සූත්‍රයේ සම්මාන කිරීම, අවමන් නොකිරීම, වගකීම් පවරා දීම... ආදි යුතුකම් ඇතුළත්වන්නේ,

(1) දෙමාපිය දූ දරු සබඳතාව තුළ ය. (2) අඹු සැමි සබඳතාව තුළ ය.
(3) හිත මිතුරු සබඳතාව තුළ ය. (4) සේව්‍ය සේවක සම්බන්ධතාව තුළ ය.

9) මහෞෂධ කුමරුගේ ප්‍රඥා මහිමය විදහාපාන ජාතක කතාව,

(1) වට්ටක ජාතකය (2) මහා කපි ජාතකය
(3) උම්මග්ග ජාතකය (4) වෙස්සන්තර ජාතකය

10) බුදු දහමේ උභයක්ඛය මරණය ලෙස හඳුන්වා ඇත්තේ,

(1) ආයුෂ ගෙවී යාම නිසා සිදු වන මරණයයි.
(2) කර්ම ශක්තිය අවසන් වීම නිසා සිදුවන මරණයයි.
(3) ආයුෂත් කර්ම ශක්තියත් දෙකම අවසන් වීම නිසා සිදු වන මරණය යි.
(4) අනතුරු ලෙඩ රෝග නිසා සිදුවන මරණය යි.

11) පංචස්කන්ධයට අයත් නොවන්නේ,

(1) රූප (2) ගෝත්‍ර (3) වේදනා (4) සඤ්ඤා

12) බුදු දහමට අනුව විභව තණ්හාව යනු,

(1) පැවැත්මට ඇති ආශාවයි.
(2) මෙලොව පස්කම් සැප විඳීමට ඇති කැමැත්තයි
(3) පස්කම් සැපයෙහි ඇලී ඉඳුරන් පිනවීමට ඇති කැමැත්තයි
(4) මරණින් පසු දෙව් ලොව ඉපදීමට ඇති කැමැත්තයි

13) කර්මයක් ලෙස දහමෙහි විස්තර කර ඇත්තේ,

(1) ක්‍රියා මාත්‍රයන් ය. (2) ඉබේ සිදුවන ක්‍රියාවන් ය.
(3) සිතා මතා කරනු ලබන ක්‍රියාවන් ය. (4) ආකස්මික ව සිදුවන ක්‍රියාවන් ය.

14) "ලෝකයේ සතරාකාර පුද්ගලයින් වෙතියි" බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර ඇත. මින් ආත්මාර්ථකාමී පුද්ගලයා අයත් වන පිළිතුර තෝරන්න.

(1) තම සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන්නෝ
(2) අනුන්ගේ සැපත යහපත ගැන පමණක් සිතා කටයුතු කරන්නෝ
(3) දෙපක්ෂයේම සැපත යහපත ගැන සිතා කටයුතු කරන්නෝ
(4) දෙපක්ෂයේම සැපත යහපත ගැන සිතා කටයුතු නොකරන්නෝ

15) බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය නම් මංගල ධර්ම දේශනාව පැවැත් වූයේ,

(1) බරණැස ඉසිපතනයේ මිගදායේ දී ය.
(2) ඉච්ඡානංගල බමුණුගම වන පියසකදී ය
(3) අචිරවතී නදී තෙරදී ය
(4) කලන්දක නිවාප යේදී ය

16) පළමු ධර්ම සංගායනාවේදී ආනන්ද තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට පවත්වාගෙන යාමට භාර වූයේ,

(1) දීඝ නිකාය (2) මජ්ඣිම නිකාය
(3) සංයුක්ත නිකාය (4) අංගුත්තර නිකාය

17) දළදා වහන්සේ සඳහා කාර්තික මංගල්‍යය නම් පහන් පූජාව සිදු කරනු ලබන්නේ,

(1) දුරුතු පෝය දා ය (2) උඳුවප් පෝය දා ය.

(3) වෙසක් පෝය දා ය (4) ඉල් පෝය දා ය.

18) අනණ සූත්‍රයට අනුව ධාර්මිකව ඉපයූ භෝගයත් එය ඉපයූ ආකාරයත් එම ධනයත් ගැන සිතා ඇති කර ගන්නා සතුට,

(1) අත්ථි සුඛය යි (2) භෝග සුඛය යි

(3) අනණ සුඛය යි (4) අනවජ්ජ සුඛය යි

19) බුදු දහමට අනුව දැහැමි රැකියාවක් නොවන්නේ,

(1) කෘෂිකර්මාන්තය (2) ගව පාලනය

(3) රාජ්‍ය සේවය (4) සත්ත්ව වෙළෙඳාම

20) වැරදි දැකීම හෙවත් මිත්‍යා දෘෂ්ටිය,

(1) කයින් සිදුවන අකුසල කර්මයකි (2) සිතින් සිදුවන කුසල කර්මයකි

(3) වචනයෙන් සිදුවන අකුසල කර්මයකි (4) සිතින් සිදුවන අකුසල කර්මයකි

(ලකුණු 2 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

**නම / විභාග අංකය :-...........................................................**

**පළමු වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**

1).

i. භික්ෂුණී ශාසනය පිහිටුවීමට මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද කාන්තාව නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ දිව්‍ය ලෝකයට කැඳවා ගෙන ගොස් දිව්‍යාංගනාවන් පෙන්වා සත්‍යාවබෝධයට මඟ පෙන්වූයේ කා හටද?

iii. ධර්ම රත්නයේ ගුණ කීය ද?

iv. "විපත්ති පටිබාහාය - සබ්බ සම්පත්ති සිද්ධියා" යන ගාථාව සජ්ඣායනා කරන්නේ කුමන අවස්ථාවකදී ද?

v. "අනුත්තර පුරිස දම්ම සාරථී බුදු ගුණයෙහි තේරුම ලියන්න.

vi. අර්ථවත් සදිසා නමස්කාරය පිළිබඳව බුදු රජාණන් වහන්සේ කරුණු දැක්වූයේ කා හටද?

vii. බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකට කෙරෙන දණ්ඩක ප්‍රශ්නය ඇතුලත් ජාතක කතාව නම් කරන්න.

viii. ධම්ම චක්කප්පවත්තන සූත්‍රයෙහි ඇතුළත් චතුරාර්ය සත්‍යයෙහි පළමු ආර්ය සත්‍යය නම් කරන්න.

ix. බුදු දහමට අනුව තණ්හාව තුන් ආකාර වේ, ඉන් කරුණු දෙකක් ලියන්න.

x. චණ්ඩාශෝක රජු ධර්මාශෝක රජු බවට පත් වුයේ කුමන ස්වාමීන් වහන්සේගේ සංවරශීලී පැවතුම්දැකීමෙන්ද?

( ලකුණු 2 x 10 = 20 )

2).

i. නව අරහාදී බුදුගුණ වලින් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. බුදුගුණ භාවනාව සඳහා සූදානම් වන ආකාරය ලියන්න. (ලකුණු 03)

iii. බුදුගුණ භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංස විස්තර කරන්න. (ලකුණු 05)

3).

i. කාව්‍යශේඛරය නම් ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න. (ලකුණු 02)

ii. පහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

පෙකණිය නොදක්වා

සළු ඇඳ බොලට දක්වා

.......................................

....................................... (ලකුණු 03)

iii. ආහාර ගන්නා විට අනුගමනය කළ යුතු යහපත් පුරුදු විස්තර කරන්න. (ලකුණු 05)

04.

i. බුදුරජාණන් වහන්සේගේ ආගමික සහනශීලීත්වය පෙන්නුම් කරන ඔබේ පෙළ පොතේ සඳහන් අවස්ථාවක් නම් කරන්න. (ලකුණු 02)

ii. පැරණි ශ්‍රී ලාංකිකයින් සතුව පැවති සාමයේ හා සහජීවනයේ සංකේත ලෙස දැක්විය හැකි කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

iii. සමාජයේ ජීවත් වන විට සහජීවනයෙන් කටයුතු කළ යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

05.

i. බුදු දහමට අනුව කර්මය දෙයාකාර වෙයි. එම දෙයාකාර කර්මය නම් කරන්න. (ලකුණු 02)

ii. කයින් සිදුවන අකුසල කර්ම තුන ලියන්න. (ලකුණු 03)

iii. ජීවිතය යහපත් ආකාරයෙන් ගොඩ නගා ගැනීම සඳහා අප ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරන්න.(ලකුණු05)

06.

i. යෝ ච පුබ්බේ පමජ්ජිත්වා

පච්ඡා සෝ නප්පමජ්ජති

...........................................

...........................................

ඉහත ධම්මපද ගාථාවේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 03)

iii. සම්මුඤ්ජනී තෙරණුවෝ අවවාද පිළිගෙන ක්‍රියාකිරීමෙන් රහත් ඵලය ලබා ගත් ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

07. මෙම ප්‍රශ්නයේ කොටස් හතරෙන් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(කොටස් දෙකකට ලකුණු 05 x 2 = 10 )

i. චුල්ලපන්ථක හාමුදුරුවෝ
ii. ආගන්තුක සත්කාරය
iii. කාම තණ්හාව
iv. ප්‍රථම ධර්ම සංගායනාව